# මුලාව සහ ව්‍යාජ පිබිදීම

- **Zac Poonen**

**සැක් පුනන්**

යේසුස්වහන්සේ සහ අපොස්තල්වරු අන්තිම දවස් වල පුළුල් ලෙස පැතිරෙන මුලාව සහ බොරු අනාගතවක්තෘන් ගැන දිගින් දිගටම අනතුරු ඇඟවූහ. ( මතෙව් 24:3-5,11,24; 1 තිමෝති 4:1) - එසේම පසුගිය දශකයන් තුල ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්ව අපි දුටිමුව.

දශ ලක්ෂ ගණන් කිතුණුවන් මෙවැනි බොරු අනාගතවක්තෘන් සහ ව්‍යාජ "පිබිදීම" තුල මුලාව සිටින්නේ ඇයි? බොහෝ දේශකයන් දුරාචාරය සහ තණ්හාවට ගොදුරුවීමෙන් වැටෙන්නේ ඇයි?

මට හැගෙන්නාවූ සමහරක් ප්‍රධාන හේතූන් කීපයක් පහත දැක්වේ.

1. අද බොහෝ කිතුණුවන් අළුත් ගිවිසුම පරිස්සමින් හදාරන්නේ නැති නිසා ඔවුන් අළුත් ගිවිසුමේ
   ඉගැන්වීම් නොදනිති. ඒ නිසා අළුත් ගිවිසුමේ ඉගැන්වීම් වෙනුවට තම **නායකයන්ගේ ඉගැන්වීම්**
   අනුගමනය කරති.

2. ඔවුන්ගේ චරිත ලක්ෂණ ( ස්වභාවෝත්තර ජීවිතය ) වලට වඩා හාස්කම් ( ස්වභාවෝත්තර **දීමනා**) ඔවුන්ට ඉතා වැදගත් වීම.

3. ඔවුන්ගේ ආත්මික සම්පතට වඩා **භෞතිකමය** සම්පත ඉතා වැදගත් වීම.

4. **ආත්මික** ආවේගයන් හෝ **මනෝමය** හැසිරවීම් සහ සත්‍යවූ ශුද්ධආත්මයාණන්ගේ ක්‍රියා කිරිම ඔවුන්ට වෙන් කර වටහා ගැනීමට නොහැකි වීම; නැවතත් මෙයට හේතුව අළුත් ගිවිසුම නොදැනුවත් කමය.

5. ඔවුන්ට **මනෝදෛහික** සුව කිරිම ( මනසේ ඇති නිවැරිදි ආකල්පයන් නිසා පැමිණෙන සුවය), සහ යේසුස් වහනසේගේ නාමයෙන් පැමිණෙන ස්වභාවෝත්තර සුවකිරීම අතර වෙනස පැහැදිලිව වටහා ගැනිමට නොහැකි වීම.

6. ස්වාමින්වහන්සේ තුල ඇතුලාන්ත ප්‍රීතියට වඩා ඔවුන්ගේ **සිත් තුල හැඟීම්** ඇවිස්සීම් සහ අමුතු ශාරීරික ක්‍රියකාරකම් වලට ප්‍රධාන තැනක් දීම.

7. නායකයින් තුල, දෙවියන්වහන්සේ සමඟ ඔවුන්ගේ අභ්‍යයන්තර ජීවිතයට වඩා සෙනඟ උදෙසා ඔවුන්ගේ **සේවය** වැදගත් වීම.

8. දෙවියන්වහන්සේගේ අනුමැතියට වඩා **මනුෂ්‍යයන්ගේ** අනුමැතිය මෙම නායකයින්ට වැදගත් වීම.

9. රැස්වීම් වලට සහභාගි වෙන්නාවූ සෙනඟ යේසුස්වහන්සේට සම්පූර්ණ කැපවීමක් වී ඇද්ද යන්නට වඩා ඔවුන්ගේ **ගණන** මේ නායකයින්ට වැදගත් වෙයි.

10 සභාව ගොඩ නගා එම සභාව තුල ඔවුන් සේවකයින් වීමට වඩා ඔවුන්ගේ **පුද්ගලික** රාජ්‍යයන් සහ මුදල් ආධිපත්‍යය ගොඩනැගිම මේ නායකයින්ට වැදගත් වී තිබේ (යෙරමියා 6:13).

මේ සියළුම දේ යේසුස්වහන්සේ ඉගැන්වූ දේට වඩා ***සම්පූර්ණයෙන් විරුද්ධය***. ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධ වීම අළුත් ගිවිසුමේ නම් කරන්නේ **"අන්ත-ක්‍රිස්තුස්"** කියාය. කිතුණුවන් මෙය පැහැදිලිව නොදකියි නම්, අන්ත ක්‍රිස්තුස් ලෝක වේදිකාවට බොරු ලකුණු සහ ආශ්චර්ය සමඟ එනකල (2 තෙසලෝනික 2:3-10), ඔවුන්ද අන්ධව ඔහුව පිළිගනියි. ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මය කරණ කොට ගෙන ගෙන යනු ලැබීමට නම් ඉහත සඳහන්වූ කරුණු වලට සම්පූර්ණයෙන් විරුද්ධවූ ආත්මයක් තිබිය යුතුය.

**මතෙව් 7:13-27** හි යේසුස්වහන්සේගේ වචන වල අනුවාදයක් පහත දැක්වේ. ( මෙය මතෙව් පරිච්ඡේද 5 සිට 7 දක්වා සම්බන්ධ කර කියවන්න ):

"***සදාතනික ජීවිතයට*** ඇතුල්වෙන මාර්ගය සහ දොරටුව යන දෙකම ඉතාමත් පටුය - මම දැන් ප්‍රකාශ කල ආකාරයට (මතෙව් 5 සිට 7 දක්වා). නමුත් බොරු අනාගතවක්තෘන් පැමිණ මාර්ගය සහ දොරටුව පහසුය සහ පළල් මිස පටු නොවේ යයි පවසති. ඔවුන්ගෙන් ප්‍රවේසම්වන්න. ඔවුන්ගේ චරිතයේ ඵල දෙස පරිස්සමෙන් බලා ඔබට පහසුවෙන් ඔවුන්ව හඳුනාගත හැකිවේ: ඔවුන් කෝපයෙන් නිදහස් ජීවිතයක් ගත කරයිද, ස්ත්‍රීන් කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් නිදහස්ද, මුදලට ඇති ආශාව සහ බොහෝ උනන්දුවෙන් භෞතික සම්පත් සෙවීමෙන් (ලෝකයේ සෙනග සොයන්නාක් මෙන්) නිදහස්ද? මම කළ ආකාරයට (මතෙව් 5:21-32 සහ 6:24-34) ඔවුන් මෙම කල කාරණා වලට විරුද්ධව දේශනා කරයිද ?

මෙම බොරු අනාගතවක්තෘවරු ඒකාන්තයෙන් මාගේ නාමයෙන් සෙනග සුවකර සහ බොහෝ ආශ්චර්‍ය දීමනා සහ භාස්කම් කරන නමුත් අවසාන දවසේ මම ඔවුන් සියළු දෙනා නිරයට යවන්නෙමි, මන්ද ඔවුන් මා (ශුද්ධ තැණන්වහන්සේ ලෙස) නොදැණ ඔවුන්ගේ පුද්ගලික ජීවිතයේ පාපයෙන් ඈත් නොවුවෝය. (මතෙව් 7: 21-23). එම නිසා කාලයේදී හෝ සදාකාලයේදී හෝ නොසෙල්වෙන එසේම නොවැටෙන පර්වතයක් මත සභාවක් ගොඩ නගන්ට ඔබට අවශ්‍යය නම් , මම ඔබට දැන් කීව සියළු දේ පරිස්සමින් කරන්ටත් (මතෙව් 5 සිට 7 ) මම අණකල සියල්ල පවත්වන පිණිසත් ඔබේ සෙනගට උගන්වන්න. එවිට මම හැම විටකම ඔබ ළඟින් සිට මාගේ බලය ඔබ පසු පස තබමි (මතෙව් 28:20-18). නමුත් මම කියන දේ ඔබ ක්‍රියා නොකර අසනවා පමණක් නම්, එවිට ඔබ ගොඩ නගන සභාව මනුෂ්‍යයාට චමත්කාරවූ, විශාලවූ එකක්වූ නමුත් එක් දවසක එය කෑලි වලට කෑඩී ඇද වැටෙනු ඇත. (මතෙව් 7:25).

එසේ නම් මේ අවසාන කාලයේ නොසෙල්වෙන සභාවක් ගොඩ නගන්නේ කෙසේද?

1. කන්ද උඩ දේශනාවට අනුව අපි ජීවත් විය යුතු අතර (මතෙව් 5 සිට 7) සහ එය නිතරම අපි දේශනා කළ යුතුද වේ.

2. අපි පරණ ගිවිසුමේ නොව අළුත් ගිවිසුමේ ජීවත් විය යුතුය. මේ සඳහා මෙම ගිවිසුම් දෙක අතර වෙනස අපි පැහැදිලිව වටහා ගත යුතුය (2 කොරින් 3:6). එලෙසම අපි අළුත් ගිවිසුම දේශනා කළ යුතුය.

අද දේශකයන් බරපතළ පාපයට වැටුන විට, පරණ ගිවිසුමේ පාපයට වැටුනාවූ ශුද්ධවන්තයන් උදාහරණයට ගෙන තමන් යුක්ති සහගත බව ප්‍රකාශ කරයි. ( ඔවුන් තුල සැනසීම සොයා ගනී ). ඊට පසු ඔවුන් නිහඬ කාලයකට පසු ඔවුන්ගේ සේවය නැවත පටන් ගනියි. කාමය වරදවා හැසිරුණාවූ දාවිත්, සහ අධෛර්‍යට පත් වූ එළියා උදාහරණයට ගෙන "දෙවියන්වහන්සේ ඔවුන්වත් උපයෝගි කරගත් සේක" යන්න ගෙන හැර දක්වයි ! නමුත් ඔවුන් ජීවිතයේ අවසානයතෙක්ම ජයග්‍රාහිකව සහ ශුද්ධ ජීවිතයක් ගත කල පාවුල්තුමා ආදර්ශයක් ලෙස ගෙන හැර නො දක්වයි.

මෙම දේශකයන් ( එලෙසම බොහෝ කිතුණුවන් ) නොදක්නා දේ නම් අද දවසේදී පරණ ගිවිසුමේ ශුද්ධවන්තයන් අපට ආදර්ශයක් ලෙස නොගත යුතු බවය. මෙම අනුග්‍රහයේ යුගය තුල අපට බොහෝ දේ දී තිබේ - එසේම "<u>යමෙකුට බොහෝදේ දෙන ලද්දේද, ඔහුගෙන් බොහෝ දේ අය කරනු ලබන්නේය</u>" (ලුක් 12:48). දාවිත් හෝ එළියා නොව - යේසුස්වහන්සේ අළුත් ගිවිසුමේ මැදිහත්කරුසේම, උන්වහන්සේ අපේ ආදර්ශයත් එසේම අද දවසේ ඇදහිල්ලේ කර්තෘවරයානොත්ය. (හෙබ්‍රෙව් 11 සඳහන්) පරණ ගිවිසුමේ ශුද්ධවන්තයන් සහ යේසුස්වහන්සේ අතර විශේෂත්වය, හෙබ්‍රෙව් 12:1-4 දක්වා පැහැදිලිව පහදා දෙයි. නමුත් ඉතාමත් සුළු කොටසක් මෙම සත්‍යතාවය තුල ජීවතවෙයි. අලුත් ගිවිසුමේ "දෙවියන්වහන්සේ අප සඳහා වඩා ***හොඳ දෙයක්*** සපයාදී ඇති" බව දකින්නේ ඉතා සුළු කොටසකි ( හෙබ්‍රෙව් 11-40).

අපි පරික්ෂාකාරිව සහ සිහිබුද්ධියෙන් නොසිටියොත්, අපෙන් ඕනෑම කෙනෙක් බොහෝ දේශකයන් වැටුනු ආකාරයට වැටෙන්ට පුළුවනි - සාතන් උපායෙහි දක්ෂ සතුරෙකි. අපේ ආරක්ෂාව රදා පවතින්නේ හරියාකාරව අළුත් ගිවිසුමේ ඉගැන්වීම්වලට කීකරුවීම සහ **භක්තිමත්** නායකත්වයට යටහත් වීමෙන්ය. (<u>"**භක්තිමත්**" නායකත්වය යනුවෙන් මම අදහස් කරන්නේ ඉහත සඳහන් කල වැරදි කරුණු දහයෙන් **එකක්වත්** ඇතිව **නොසිටීමයි**</u>). අපි අන් අයගේ වැරදීම් තුලින් ඉගෙන ගන්නවා නම්, එම වැරදීම කිරීමෙන් අපට වැළකිය හැක.

එම නිසා යොහාන්තුමා කලාක් මෙන්, අපේ මුහුනු නිතරම දෙවියන්වහන්සේ ඉදිරියේ දුවිල්ලේ තබා ගනිමු, එවිට අපට දිව්‍යමය එළිදරව් වීම ලබා ගත හැකිය (එළිදරව් 1:17). අපි, අපව යටහත් කර ගන්නා විට, ජය ගැනීම සඳහා අනුග්‍රහය අපට ලැබෙනු ඇත (1 පේත්‍රුස් 5:5). **දෙවියන් වහන්සේගේ වචනයේ** සත්‍යයතාවය සහ **අප ගැන** සත්‍යය ශුද්ධාත්මයාණන් අපට පෙන්වා දෙන විට සම්පුර්ණයෙන්ම අපි අවංක වී සියළු පාපයෙන් "ගැළවෙන පිණිස, සත්‍යට ප්‍රේම කරමු". ඒ ආකාරයෙන් දෙවියන්වහන්සේම මුලාවෙන් අපව ආරක්ෂා කරන සේක (2 තෙසලෝනික 2:10,11) ආමෙන්.

Counterfeit Revival - Sinhala

© Copyright -
This article has been copyrighted to prevent misuse. It should not be reprinted or translated without written permission from the author. Permission is however given for this article to be downloaded and printed , provided it is for FREE distribution, provided NO ALTERATIONS are made, provided the AUTHOR'S NAME AND ADDRESS are mentioned and provided this COPYRIGHT notice ["Copyright by Zac Poonen"] is included in each printout.

For further details, please contact :
**CHRISTIAN FELLOWSHIP CENTRE**
40 DaCosta Square,
St.Thomas Town,
Bangalore - 560 084. INDIA.

Phone :(91)-(80)-25477103
Email :cfc@cfcindia.com web : www.cfcindia.com